TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන.
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1 , එලිබෑන්ක් පාර , කොළඹ.
2019.10.15.

මහින්ද දේශප්‍රිය මහතා ,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය .

මහත්මයාණෙනි,

<u>මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජයට අයත් පරිශ්‍රයන් අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය වන ආකාරයෙන් භාවිතා කිරීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට ලැබී ඇති පැමිණිල්ලකට අනුව 2019. 10. 13 දින කඩවත ප්‍රධාන බස් නැවතුම්පොළට අයත් පරිශ්‍රය ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ රැස්වීමක් සඳහා යොදා ගෙන ඇත. මේ සම්බන්ධයෙන් අදාල බලධාරී ආයතන් මගින් අය කිරීමක් සිදුකර ඒ සඳහා අවසර ලබා ඇති ද යන්න විමසා සිටියත් ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් දැක්වීමට ඔවුන් අපොහොසත් විය. මෙම සිදු වීමට අදාල ඡායාරූප ද මේ සමග අමුණා ඇත.

අපේක්ෂකයන් ගේ රැස්වීම් ආදියට ගාස්තු නොගෙවා රාජ්‍ය පරිශ්‍රයන් භාවිතා කිරීම 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ ඇති විශේෂ ගැසට් පත්‍රයේ අංක 6(ii) නියමය අනුව නීති විරෝධී වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයා බලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා බස්නාහිර පළාත් සම්බන්ධීකාරක සංජී අමා මෙනවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 076 322 344 2 / 076 322 366 2 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය(TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දි පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට ,
විශ්වාසී ,

Lakwijaya Bandara

ලක්විජය බණ්ඩාර,
ජාතික සම්බන්ධීකාරක.





